RG/NB/01/චක්‍රලේඛ

2014.03. 03

චක්‍රලේඛ අංක : 02/2014

සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වෙත,

**<u>ඔප්පු වලට අලවා ඇති අඩු මුද්දර ගාස්තු සහ හිඟ දඩ මුදල් අය කර ගැනීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් අමතන ලද රෙජි.ජ.ගේ සමාංක හා 2013.12.23 දින දරණ අංක 14/2013 දරණ චක්‍රලේඛ ලිපියට අමතර වශයෙනි.

02. එකී චක්‍රලේඛ ලිපිය මගින් දක්වා ඇති කරුණු වලට අමතරව නොතාරිස්වරුන් විසින් ලියා සහතික කරනු ලබන පැවරුම් හා විකුණුම් ඔප්පු වලට අදාලව නියමිත මුද්දර ගාස්තු බැංකුව වෙත ගෙවීමේදී යම් යම් අපහසුතාවයන් පවතින බව ද සාකච්ඡා විය. මේ පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලද අතර එක් එක් ප්‍රඥප්ති වල සඳහන් වන පරිදි බැංකු වලට මුද්දර ගාස්තු ගෙවීමේදී දැනට දින 7ක උපරිම සහන කාලයක් ලබා දී ඇති අතර දින 7ක් ඇතුළත දී ගාස්තු ගෙවීමට නොහැකි වන නොතාරිස්වරුන්ට එම කාල සීමාව දින 14 ක් දක්වා සහන කාලයක් ලබා දීමට එකඟතාවය පළ විය.

ඉහත සඳහන් පදනම යටතේ ඔප්පු පිටපත් පරීක්ෂා කිරීමේදී ඊට පටහැනිව ක්‍රියා කර ඇති බව අනාවරණය වන්නේ නම් මුද්දර ගාස්තුව රු.5000/- ට අඩු හා වැඩි සෑම අවස්ථාවකදීම රෙජි.ජ.ගේ සමාංක හා 2013.12.31 දින දරණ අංක 15/2013 දරණ චක්‍රලේඛනයේ 2.4 හි සඳහන් ආකෘති භාවිතා කරමින් පළාත් ආදායම් කොමසාරිස්වරුන් වෙත ඒ බව දන්වා යැවීමට පියවර ගන්න.

03. එක් එක් පළාත් සභා වලට අදාල ප්‍රඥප්ති සුදුසු පරිදි සංශෝධනය කිරීම ඒ ඒ පළාත් පාලන ආයතන මගින් ඉදිරියේ දී සිදුකිරීමට ද තීරණය විය.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්

රංජිත් දයානන්ද
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත් :

1. ලේකම්, රාජ්‍ය පරි. හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - දැන ගැනීම සඳහා
2. විගණකාධිපති - දැන ගැනීම සඳහා
3. සියළුම පළාත් ආදායම් කොමසාරිස්වරුන්-දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා
4. ප්‍රධාන ගණකාධිකාරී - දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා
5. සියළුම කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් -දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා